සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# තෙවන වාර පරීක්ෂණය 2019
# ඉස්ලාම් ධර්මය - I

10 ශ්‍රේණිය | කාලය පැය 01 යි.

නම/ විභාග අංකයඃ

සැලකිය යුතුයි :
- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්න වල දී ඇති 1, 2, 3, 4 පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.

---

01 ඉස්ලාමීය විශ්වාසය හා ඒ සම්බන්ධ වූ කලාව වන්නේ,
(1) ඉල්මුල් මීරාස් (2) ඉල්මුල් අකීදා (3) ඉල්මුල් ෆික්හ් (4) ඉල්මුල් ආහිරා

02 නබි (සල්) තුමාණන්ගේ ජීවිත ඉතිහාසය ගැන සඳහන් කිරීමට භාවිතා කරන වචනය
(1) හදීස් (2) සීරා (3) ඉජ්මා (4) වරාසත්

03 නිශ්ශබ්දතාවය සමග වූ ඉජ්මාව හැඳින්වෙන්නේ,
(1) ඉජ්මා සුකුති (2) ඉජ්මා සරීහ් (3) ඉජ්මා මුරක්කල් (4) ඉජ්මා අක්සරියියා

04 අර්කානුල් කියාසෙහි ඇතුළත් වන්නේ,
(1) අල් අදබ් (2) අල් ෆරූ (3) අල් කිද්බ් (4) අල් වහ්යු

05 අල් කුර්ආනය කටපාඩම් කළ අය අමතනු ලබන්නේ,
(1) මෞලවි (2) ආලිම් (3) කාරි (4) හාෆිල්

06 අල්මාඋත් තාහිර්ට උදාහරණයක් (නිදසුනක්) වන්නේ,
(1) මුහුදු ජලය (2) අපිරිසිදු ජලය (3) තේ (4) ළිං වතුර

07 අල් කුර්ආනයේ සඳහන් වී ඇති සිත්වල වර්ග
(1) 2 (2) 3 (3) 4 (4) 5

08 නිරාස ජීවිතය යන්නෙහි අරාබි තේරුම වන්නේ,
(1) සුහ්ත් (2) වරළ (3) රිළා (4) මුහම්මද්

09 ''නුඹලා අතරින් ලස්සන ක්‍රියාව ඇත්තා කවරෙකුදැයි සෝදිසි කිරීම පිණිස ඔහුම මරණය හා ජීවනය මැව්වේ ය.'' මෙම වැකිය
(1) නබි (සල්) තුමාණන්ගේ (2) අබූබක්කර් (රළි) තුමාගේ
(3) අල් කුර්ආනයෙහි (4) ඉමාම් අහ්මද්ගේය

10 නබි ඉස්මායීල් (අලෛ) තුමාගේ පියා
(1) නබි මූසා (අලෛ) (2) නබි දාවූද් (අලෛ)
(3) නබි ඊසා (අලෛ) (4) නබි ඉබ්‍රාහිම් (අලෛ)

11 ප්‍රථම දේව වාක්‍ය පහළ වූ අවස්ථාවේ නබි (සල්) තුමාණන්ගේ වයස
(1) 63 (2) 53 (3) 25 (4) 40

12 අල් කුර්ආනය ග්‍රන්ථාරූඪ කිරීමට කලීෆා අබූබක්කර් (රළි) තුමාට උපදෙස් දුන් සහාබිවරයා කවුද?
(1) සෙයිද් බින් සාබිත් (රළි) (2) හුතෛෆතුල් යමානි (රළි)
(3) උස්මාන් (රළි) (4) උමර් (රළි)

13 හදීස් යන පදය වෙනුවෙන් සඳහන් වන වෙනත් පද
(1) තෆ්සීර් - බයාන් (2) සුන්නා - හබර්
(3) හබර් - බයාන් (4) බයාන් - කුත්බා

14 සුහුඵුවල මුළු සංඛ්‍යාව

(1) 100 (2) 313 (3) 110 (4) 210

15 ඉස්ලාමීය අකීදාව ආරක්ෂා කළ ඉමාම්වරයෙකු වන්නේ,

(1) ඉමාම් අබූ හනීෆා (රහ්) (2) ඉමාම් මාලික් (රහ්)

(3) ඉමාම් සාෆි (රහ්) (4) ඉමාම් අහ්මද් බින් හන්බල් (රහ්)

16 ජනාසා සඳහා වූ යුතුකම් ඉටුකිරීම

(1) ෆර්ලු අයින් (2) ෆර්ලු කිෆායා (3) මක්රූහ් (4) වාජිබ්

17 පහත සඳහන් සලාතයේ ෆර්ඩු නොවෙන ක්‍රියාව

(1) ෆාතිහා සූරාව පාරායනා කිරීම. (2) (ප්‍රථම) ආරම්භක තක්බීර් කීම.

(3) කිබ්ලාව පෙරටුකර ගැනීම. (4) රුකූඋ කිරීම.

18 රුකූඋ - සුජුද් නොමැති සලාතය

(1) ග්‍රහණය සලාතය (2) වර්ෂාව ලබාගැනීම සඳහා වූ සලාතය

(3) ජනාසා සලාතය (4) ගමනක් සඳහා වූ සලාතය

19 X, Y කොටස් දෙක නිවැරදිව යා කළ විට ලැබෙන උත්තරය

| X | Y |
|---|---|
| තෞබා | A තැන්පත් භාවය |
| ඉඛ්ලාස් | B දේව වාක්‍ය |
| වරඋ | C පවෙන් මිදීම |
| වහී | D මනස් පවිත්‍රය |

(1) ABCD (2) CDAB (3) ADBC (4) BADC

20 සුජුද් කරන විට පොළොවෙහි ගැවෙන ශරීරයේ කොටස්

(1) 2 (2) 5 (3) 6 (4) 7

21 කස්රු කර හෝ ජම්උ කර නැමදීමට නොහැකි සලාතය

(1) මඃරිබ් (2) ඉෂා (3) ලුහර් (4) සුබහ්

22 තව්හීදයට විරුද්ධ පදය කුමක් ද?

(1) කුෆ්ර් (2) නිෆාක් (3) ෂිර්ක් (4) ඉල්හාද්

23 යකඩවල ප්‍රයෝජනය දැන එය තලා පාත්‍ර සෑදූ නබිවරයා

(1) නූහ් (අලෛ) (2) දාවුද් (අලෛ) (3) ඊසා (අලෛ) (4) මූසා (අලෛ)

24 පහත සඳහන් අයගෙන් අජ්නබි නොවන්නේ,

(1) මවගේ සහෝදරිය (2) බාප්පාගේ දුව

(3) මාමාගේ දුව (4) පියාගේ සහෝදරියගේ දුව

25 නබිවරුන්ට ප්‍රදානය කරන ලද හාස්කම් ගැන සඳහන් වන පදය

(1) කරාමත් (2) මුඃජිසාත් (3) හිදායත් (4) රිසාලත්

26 ඉස්ලාමීය නීති මූලයන් අතර සසඳා බැලීම යනු අමතන්නේ කෙසේද?

(1) මස්ලහා (2) ඉජ්මා (3) හදීස් (4) කියාස්

27 අල්මාඋල් මුස්තඃමල් යනුවෙන් අදහස් වන්නේ,

(1) පිරිසිදු ජලය (2) අපිරිසිදු ජලය (3) භාවිතා කළ ජලය (4) අති ශුද්ධ ජලය

28 වැඩි ජනතාවක් අලසකම දක්වන ක්‍රියාවල් දෙකින් හදීසයෙහි සඳහන් වූ එකක් වන්නේ,

(1) පිරිසිදුකම (2) රෝගී බව (3) අධ්‍යාපනය (4) සෞඛ්‍යය

29 ස්පෙයින් රට අත්පත් කරගත් වීරයා වන්නේ,

(1) මුහම්මද් බින් කාසිම් (2) මුහම්මද් අල් ෆාතිහ්

(3) මුහම්මද් අල් කුද්ස් (4) තාරික් බින් සියාද්

30 බද්ර් යුද්ධය සිද්ධ වූ හිජ්රි වර්ෂය

(1) හිජ්රි 1 (2) හිජ්රි 2 (3) හිජ්රි 3 (4) හිජ්රි 5

31 නබි (සල්) තුමා තම මිත්‍රයින් ප්‍රථමවරට හිජ්රත් යැවූ ප්‍රදේශය

(1) හබෂා (2) මදීනා (3) කුෆා (4) තායිෆ්

32 දෙවන අකබා ගිවිසුම පැවැත්වුණු වර්ෂය

(1) නුබුව්වත් 10 (2) නුබුව්වත් 11 (3) නුබුව්වත් 12 (4) නුබුව්වත් 13

33 මදීනාවෙහි පැරණි නම

(1) බක්කා (2) හබෂා (3) ෂාම් (4) යස්රිබ්

34 නබි (සල්) තුමාණන්ගේ ජීවිත කථාව ප්‍රථමවරට ග්‍රන්ථාරූඪ කළ පුද්ගලයා කවුද?

(1) මුහම්මද් බින් ඉස්හාක් (2) මුහම්මදු බින් හිෂාම්

(3) මුහම්මද් බින් කාසිම් (4) මුහම්මද් බින් මස්ලමා

35 වඩු වැඩ ගැන ප්‍රථම වරට ලොවට හඳුන්වා දුන් නබිතුමා

(1) නබි ඉද්රීස් (අලෛ) (2) නබි නූහ් (අලෛ) (3) නබි දාවුද් (අලෛ) (4) නබි මූසා (අලෛ)

36 අජ්නබි යන පදයේ තේරුම

(1) ආගන්තුකයෝ (2) ඥාතියෝ

(3) විවාහ වීමට අනුමැතිය නොවන අය (4) ගෞරවයට පාත්‍ර වූවන්

37 ප්‍රථමවරට ඉස්ලාම් ආගම වැළඳ ගත් සහාබිවරයා

(1) අබුබක්කර් (රළි) (2) අලි (රළි) (3) කදීජා (රළි) (4) උස්මාන් (රළි)

38 ජාමිඋල් කුර්ආන් නමැති විශේෂ නාමයෙන් හැඳින්වෙන්නේ

(1) අබුබක්කර් (රළි) (2) උස්මාන් (රළි) (3) අලි (රළි) (4) උමර් (රළි)

39 අර්රිසාලත් යනුවෙන් හැඳින්වෙන්නේ,

(1) නබිත්වය (2) සහෝදරත්වය (3) දූත භාවය (4) අවසන් දිනය

40 වර්තමාන හිජ්රි අවුරුද්ද වන්නේ,

(1) 1438 (2) 1439 (3) 1440 (4) 1441

(1 x 40 = 40)

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# තෙවන වාර පරීක්ෂණය 2019

**10 ශ්‍රේණිය** **ඉස්ලාම් ධර්මය - II** **කාලය පැය 02 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

- **පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න 4 කට පිළිතුරු සපයන්න.**

(01) පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.
(i) අවසාන දිනය ගැන වූ විශ්වාසය අකීදාවෙහි කුමන අංශයට අතුළත් වේද?
(ii) 'වහි'යෙහි කොටස් දෙක කුමක් ද?
(iii) සබූර්, ඉන්ජීල් ආගම් පහළ වූ භාෂාවන් කුමක් ද?
(iv) 'තර්තීබුන් නුසූල්' යනු කුමක් ද?
(v) කොන්ස්තන්තිනොබලය ජයග්‍රහණය කළ මුස්ලිම් සේනාධිපති කවුද?
(vi) ජබීරත් යනු කුමක් ද?
(vii) වසතියියා යන පදය පැහැදිලි කරන්න.
(viii) උප නීති මූලයන් දෙකක් නම් කරන්න.
(ix) සලාතයේ ක්‍රියාවන් මගින් ඉටු කළ යුතු ෆර්ලයන් දෙකක් නම් කරන්න.
(x) විවාහය මගින් නෑයන් වන අයගෙන් මහ්රම් වන දෙදෙනෙකු සඳහන් කරන්න.

02 (i) නජීස් යනු කුමක් ද?
(ii) නජීස් වර්ග කර ඒවාට එක් එක් උදාහරණ දක්වන්න.
(iii) සලාතය මගින් ලැබෙන ලෞකික ප්‍රයෝජන 5 ක් ලියන්න. (ලකුණු $2+3+5=10$)

03 (i) අකීදා යනු කුමක් ද?
(ii) අකීදාවෙහි කොටස් මතුවීමට හේතු වූ කාරණා 3 ක් ලියන්න.
(iii) මනස පරිශුද්ධ වීමට පිළිපැදිය යුතු කරුණු පහක් දක්වන්න. (ලකුණු $2+3+5=10$)

04 (i) රක්ෂාවෙහි වැදගත්කම තහවුරු වන කුර්ආන් වැකියක් හෝ හදීසයක් ලියන්න.
(ii) වෙළඳාමේ තිබෙන මූලික දේවල් තුනක් ලියන්න.
(iii) ඉස්ලාම් ලබාදී ඇති මිනිස් අයිතිවාසිකම් පහක් ලියන්න. (ලකුණු $2+3+5=10$)

05 (i) ෆික්හුල් අව්ලවිය්යාත් යනු කුමක් ද?
(ii) සූරත්තුල් ලුක්මාන්හී දක්වා ඇති යහ ගුණ තුනක් ලියන්න.
(iii) ඉස්ලාමීය ආර්ථික ක්‍රමවේදවල ඇති ලක්ෂණ පහක් ලියන්න. (ලකුණු $2+3+5=10$)

06 (i) ඉමාරත් යනු කුමක් ද?
(ii) අල්කුර්ආනය සඳහන් කරන සිත්වල තත්වයන් මොනවා ද?
(iii) එදිනෙදා කටයුතු ඉබාදත් වීමට ඇති කොන්දේසි පහක් ලියන්න. (ලකුණු $2+3+5=10$)

07 පහත සඳහන් මාතෘකාවලින් දෙකකට කෙටි සටහන් ලියන්න.
(i) රකියාවේ වැදගත්කම
(ii) සුන්නාවෙහි වැදගත්කම
(iii) අල්කුර්ආනයේ සම්පාදනය
(iv) ඉජ්මා (ලකුණු $5+5=10$)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(2) | 2 -(2) | 3 -(1) | 4 -(2) | 5 -(4) | 6 -(3) | 7 -(2) | 8 -(1) | 9 -(3) | 10-(4) |
| 11-(4) | 12-(4) | 13-(2) | 14-(3) | 15-(4) | 16-(2) | 17-(3) | 18-(3) | 19-(4) | 20-(4) |
| 21-(4) | 22-(3) | 23-(2) | 24-(1) | 25-(2) | 26-(4) | 27-(3) | 28-(2) | 29-(4) | 30-(2) |
| 31-(1) | 32-(3) | 33-(4) | 34-(1) | 35-(2) | 36-(1) | 37-(3) | 38-(2) | 39-(3) | 40-(4) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

## II කොටස

(01) (i) අස්සමීඉයියාත් නමැති කොටසේ
(ii) වහි මතුලුවිවු, වහී ගයිරු වතුලුවිවු
(iii) සබූර් - යුනානි, ඉන්ජීල් - සූර්යානි
(iv) අල්කුර්ආනය පහළ කළ පිළිවෙල
(v) මුහම්මද් අල් ෆාතිහ්
(vi) තුවාලවලට දමන ලද වෙළුම් පටිය
(vii) මධ්‍යස්ථ භාවයේ ප්‍රතිපත්තිය
(viii) ඉජ්මා, කියාස්, උර්පු, මස්ලිහා, කව්ලුස්සහාබා ආදී
(ix) සිටගැනීම, රුකුඋ, සුජූදු කිරීම, ඉඃතිදාල් හි සිටීම යනාදී
(x) මව, මවගේ මව, මවගේ සහෝදරිය, පියාගේ සහෝදරිය, දුව යන අය

02 (i) අපවිත්‍ර දේවල් නජීස් වේ. නජීස් වර්ග තුනක් වේ.
(ii) මෘදු නජීස් උදාඃ- කිරි පමණක් බී වැඩෙන වයස අවුරුදු දෙකකට අඩු පිරිමි දරුවන්ගේ මුත්‍රා
සාමාන්‍ය නජීස් උදාඃ- මළ මුත්‍රා, ලේ, සැරව, වමනය, මධ්‍යසාර යනාදී
කඨින නජීස් උදාඃ- ඌරන්, බල්ලන් හා මොවුන්ගේ මළ මුත්‍රා, කෙළ, සොටු, ලේ යනාදී
(iii) * සමානාත්මතාවය, සහෝදරත්වය * එක්සත්කම, සමගිය
* කාල වේලාව කළමනාකරණය * ශාරීරික අභ්‍යාසය
* ශාරීරික පිරිසිදුකම * යුධ පුහුණුව

03 (i) ඉස්ලාමීය විශ්වාස ප්‍රතිපත්තිය
(ii) * මෝඩ විශ්වාස
* වෙනත් ආගම් ආක්‍රමණය
* බුද්ධිය අසීමිතව භාවිතා කිරීම
* පර්යේෂණ නොකරන්න කියා වැළැක්වූ දේවල් පර්යේෂණ කිරීම
* අකීදාවෙහි සරල භාවය අනුගමනය නොකිරීම
(iii) * තව්බා කිරීම * කුර්ආනය පාරායනා කිරීම
* දිනපතා දික්ර් කිරීම * සුන්නත් වූ ක්‍රියාවන් කිරීම
* ෆර්ල් වූ ක්‍රියාවන් කිරීම * හොඳ පරිසරයක ජීවත්වීම
* උතුම් මිත්‍රත්වය

04 (i) සුදුසු කුර්ආන් වැකි, හදීස්වලට ලකුණු දෙන්න.
(ii) * වෙළඳාම් ද්‍රව්‍ය * බඩු ගන්නා හා විකුනන්නා * ඊජාබ් - කබූල්
(iii) * ජීවත්වීමේ අයිතිය * සමනාත්ම අයිතිය * ඒක පුද්ගල නිදහස් අයිතිය
* නීතිය ලබාගැනීමේ අයිතිය * ගෞරවය රැකගැනීමේ අයිතිය
* වස්තු රැකගැනීමේ අයිතිය * ආගම් පිළිපැදීමේ අයිතිය

05 (i) ප්‍රමුඛත්වය දිය යුතු දේ පිළිබඳ වූ නීතිරීති
(ii) ශිර්ක් නොකිරීම (අල්ලාහ් තආලාට කිසිවක් සම නොකිරීම)
(iii) හොඳ නරක පහදා දීම / ඉවසීම / ශබ්දය අඩු කිරීම / අහංකාරව නොසිටීම යනාදී

06 (i) පොළොව සරුකිරීම
(ii) නෆ්සුල් අම්ටාරා / නෆ්සුල් ලව්වාමා / නෆ්සුල් මුතුමඉන්නා
(iii) පවිත්‍ර චින්තනය / ඉස්ලාමීය අනුමැතිය / ඉස්ලාමීය සීමාවන් කඩකිරීම / මූලික නැමදුම්වලට බාධා නොවීම / පිළිවෙල

07 කිසියම් මාතෘකාවකට අදහස් පහක් ලියා ඇතොත් ලකුණු 5 ක් දෙන්න. (ලකුණු 5 x 2 = 10)